# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVII | SEPTEMBER 2023 | Issue No. 10


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 101:1-8)**

01. කරුණාවද යුක්තියද ගැන ගී කියන්නෙමි. ස්වාමිනි, ඔබට ප්‍රශංසා ගී කියන්නෙමි.

02. නුවණැතිව නිර්දෝෂ මාර්ගයක හැසිරෙන්නෙමි. ඔබ කවදා මා වෙත එනසේක්ද? මම නිදොස් සිතකින් මාගේ ගෙයි හැසිරෙන්නෙමි.

03. මාගේ ඇස් හමුයෙහි කිසි නීච දෙයක් තබා නොගන්නෙමි. ඉවතට හැරෙන්නන්ගේ ක්‍රියාව නුරුස්සමි; එය මට නොඇලෙන්නේය.

04. මුරණ්ඩු සිතක් මා කෙරෙන් දුරුවන්නේය. නපුරු දෙයක් දැන නොගන්නෙමි.

05. යමෙක් ස්වකීය අසල්වාසියා ගැන රහසේ කේලාම්කියයිද ඔහු විනාශකරන්නෙමි. උඩඟුරූ බැල්මක් හා ආඩම්බර සිතක් ඇත්තා නොඉවසන්නෙමි

06. දේශයේ විශ්වාසකටයුතු අය මා සමඟ වසන පිණිස ඔවුන් කෙරෙහි මාගේ ඇස් යොමා තිබෙන්නේය. නිර්දෝෂ මාර්ගයෙක්හි හැසිරෙන තැනැත්තේම මට මෙහෙකරන්නේය.

07. වංචාකරන කිසිවෙක් මාගේ ගෙයි නොවසන්නේය; බොරුකියන කිසිවෙක් මාගේ ඇස් හමුයෙහි පිහිටුවනු නොලබන්නේය.

08. අයුතුකම් කරන සියල්ලන් ස්වාමීන්ගේ නුවරින් සිඳදමන පිණිස දේශයේ සියලුරූ දුෂ්ටයන් උදයක් පාසා විනාශකරන්නෙමි.



# හිය නොවන්න

**FEAR NOT!** Isaiah 41:10 (යෙසායා 41:10)

**A message that will strengthen your faith! Please read attentively!!**

*(පාස්ටර් එස්. සෑම් සෙල්ව රාජ්)*

සමහර මනුෂ්‍යයන් පවසන්නාවූ දෙයක් නම්, ''මම සෑම දිනකම උදෑසන අවධිවනු ලබන්නේ මා මුහුණ දෙනු ලබන ප්‍රශ්න වචන වලින් කියා නිම කිරීමට බැහැයි'' යනුවෙනි. ඔවුන් මුහුණ දෙනු ලබන ප්‍රශ්න නම්, ශාරීරික, මානසික හා පවුල තුළින් ඇතිවන ප්‍රශ්නයි. බොහෝ අය කරදර පිට කරදර වලට මුහුණ දෙනු ලබයි. ඉතා කනස්සල්ලෙන් යුතුව ජීවත් වෙනු ලබයි. මේ සියලු දේ වලට මුහුණ දෙන්නාවූ ඔවුන් පවසන්නාවූ දෙය නම්,''මට මෙය දරා ගැනීමට බැහැ ප්‍රශ්න කන්දක් මට තිබෙනවා. ඒවාට විරුද්ධව සටන් කිරීමට මට බලයක් නැහැ. මේ සියල්ලෙන් මා ජයගන්නේ කෙසේද?'' කියමින් කනස්සල්ලට පත් වෙති. සමහර විට ඔබගේ අත්දැකීම්ද මෙලෙස විය හැකිය.

බොහෝ දෙවියන්වහන්සේගේ දරුවන්ගෙන් ඔවුන් මුහුණ දෙනු ලබන කරදර හා ප්‍රශ්න සම්බන්ධව සඳහන් කරමින් දිනපතාම අපගේ කාර්යාලයට ලිපි එවනු ලබයි.

දින කීපයකට පෙර දවසකදී එක් වරුවක්ම මෙලෙස ප්‍රශ්න ලියා ඒවා තිබූ ලිපි කියෙව්වෙමි.

මා විවාහවී වසර 35 කි. මා දැන් ආච්චි කෙනෙකි. නමුත් මාගේ ස්වාමිපුරුෂයා විසින් මාගේ පවුල විනාශකර තිබේ. මගේ ස්වාමි පුරුෂයා දෙවියන්වහන්සේගේ ආලේපය ලැබූ තැනැත්තෙකි. දෙවියන්වහන්සේ ඔහුව ඉතා බලවත් ලෙස පාවිච්චි කලේය. නමුත් ඔහු තුල තිබූ ශුද්ධ ගින්න දැන් නිවී ඇත. කරුණාකර ඔහු නිසාත් අපගේ පවුල ගැනත් යාච්ඤා කරන්න. ඔහු මට ප්‍රේම කරන්නේද නැත. මා ඉතාම කනස්සල්ලෙන් යුතුව ජීවත් වෙමි.

මෙම කාන්තාවගේ ජීවිතයේ සියලු ආකාර වේදනා සහ කලකිරීම් වලින් බිරී ඇතිමුත් ඇය තවමත් ඇගේ ස්වාමිපුරුෂයාට ප්‍රේම කරයි. ඔහු තම නපුරු මාර්ගයෙන් නැවත හැරී දෙවියන්වහන්සේගේ මාර්ගයට එන පිණිස ඇය ආශා

3 වෙනි පිටුවට ...




**Echo of His Call**

***Christian YouTube Channel!***

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**


Every day – 5.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

*from your dearly beloved brother...*

REACHING NATIONS





## කැඳවීමේ ප්‍රතිරාවය

**"....කුඩා තැනැත්තා දහසක්ද සුළු තැනැත්තා බලවත් ජාතියක්ද වන්නේය. ස්වාමිවූ මම ඒකේ නියම කලට ඒක ඉක්මන් කරන්නෙමි...."**

**(යෙසායා) 60:22)**

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රේමවන්තයෙනි,**

අපගේ ස්වාමීවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඔබට සුභ පතමි

ඔබ සැමදෙනාම ඉතා සුවෙන් සිටින බව විශ්වාස කරමි. ඔබ වෙනුවෙන් අපි යාච්ඤා කරමු. ස්වාමීන්වහන්සේ ඔබ සමඟ සිටිමින් ඔබව ධෛර්‍යමත් කරන සේක.

අප කරන සියලුම ක්‍රියාවන් හා සේවයේදී කන්නාවූ සෑම දේ තුලින්ම අප බලවත් හස්තය අපි දුටුවේය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ රෑ දාවල් අපව රැක බලා ගත්තේය. අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

අපගේ සේවය තුළ සිටින්නාවූ බොහෝ දේව දාසයින් අසනීප තත්වයෙන් සිටී. මේ නිසා දෙවියන්වහන්සේගේ සේවයන් සම්පූර්ණ කිරීමට ඔවුන්ට අපහසු වී තිබේ. අප ඔබගෙන් ඉල්ලා සිටින්නේ මෙම දේව දාසයින් උදෙසා විශේෂයෙන් යාච්ඤා කරන ලෙසයි.

කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව සෑම මාසයකදීම නොකඩවාම ඔබට ලැබෙන්නේ නැති බව අපට දැනගැනීමට හැකි විය. මේ පිළිබඳව අප ඉතාම කණගාටු වෙමු. අප එවන්නාවූ සඟරාව සහ ලිපි වලට කුමක් සිදුවෙනවාද කියා අපට සිතා ගැනීමට බැරිය.

අප නොකඩවාම ඒ ගැන සොයා බලමු. සමහර ස්ථානවල දොර වසා ඇත, ස්ථානය අත්හැර ගොස් ඇත, මියගොස් ඇත, ප්‍රතික්ෂේප කරයි කියා නොයෙකුත් කාරණාවන් පවසමින් අපට දැනුම් දෙයි. නමුත් මෙය සත්‍ය වූ කාරණාවන් නොවෙයි කියා අපට දැනගැනීමට හැකිවිය. ඔබත් සමඟ අපට තිබෙන්නාවූ සම්බන්ධතාවය සහ සහභාගීත්වය අප නැතිකර ගැනීමට අකමැතිය. මන්ද ඔබ අති විශිෂ්ඨය. එබැවින් ඔබගේ මිත්‍රයින්ට නිසි වේලාවට කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව නොලැබුනේ නම්, ලිපි මඟින්, අන්තර් ජාලය හරහා හෝ WhatsApp වලින් අපව දැනුවත් කරන්න. ඔබගේ ලිපිනය වෙනස්වී ඇත්නම් ඔබගේ පරණ ලිපිනය සහ අලුත් ලිපිනය අප වෙත එවන්න. එවිට මෙම සඟරාව ඔබ වෙතට වෙලාවට එවීමට අපට හැකිය. ඔබගේ අන්තර්ජාල ලිපිනය අප වෙත එවන්න.

කැඳවීමේ සඟරාව භාෂා 16 කින් සෑම මාසයකදී තැපැල් මාර්ගයෙන් පහත සඳහන් දිනයන්හිදී අප එවනු ලබයි.

1. දෙමළ - පෙර මාසයේ 28 වෙනිදා
2. ඉංග්‍රීසි - සෑම මාසයකම 2 වෙනිදා
3. සිංහල - සෑම මාසයකම 2 වෙනිදා
4. ඇෆ්රිකානාස් - සෑම මාසයකම 4 වෙනිදා
5. මලයාලම් - සෑම මසකම 4 වෙනිදා
6. තෙලිගු - සෑම මසකම 6 වෙනිදා
7. හිංදි - සෑම මසකම 9 වෙනිදා
8. කණ්නඩා - සෑම මසකම 10 වෙනිදා
9. මරාති - සෑම මසකම 12 වෙනිදා
10. අසාමි - සෑම මසකම 12 වෙනිදා
11. බෙංගාලි - සෑම මසකම 14 වෙනිදා
12. උර්දු - සෑම මසකම 14 වෙනිදා
13. නේපාලි - සෑම මසකම 16 වෙනිදා

**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

**CHIEF EDITOR**

Pastor Alex Samson Sam, B.Th., M.Div.

**ADMINISTRATION**

Bro. N. Prakasam, M.A., General Manager
Dr. Rabinder Boaz, M.S.
Bro. K. Puratchivendan

**EDITORIAL BOARD**

Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Dr. A. Richard Samuel, M.A., Ph.D.
Rev. Dr. K.R. Rajasekaran

**EDITOR, PUBLISHER & PRINTER**

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858

**E.mail ID**

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**

www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

**YOUTUBE CHANNEL**

Echo of His Call

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ☼ BIBLECOR - Postal Courses (3 languages) ☼ Media Ministry ☼ Online Courses ☼ Theological Correspondence Courses (2 languages) ☼ Church Planting ☼ Nehemiah Bible Colleges ☼ Gospel Printing Press ☼ Great Commission Partners ☼ St. Paul's Matriculation School ☼ Crusades ☼ Community Development

14. ගුජරාති - සෑම මසකම 16 වෙනිදා
15. ඔඩිසා - සෑම මසකම 18 වෙනිදා
16. පංජාබි - සෑම මසකම 20 වෙනිදා

මෙම දිනයන් වලදී මෙම සඟරාව අපගේ අන්තර්ජාල පිටුව වන www.echoofhiscall.org හි අප නිකුත් කරමු. කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න. අපගේ පුවත් සහිත ලිපිය සෑම මාසයකදීම ඔබ වෙත එවන පිණිස 75 දෙනෙකුගෙන් සමන්විත වූ කණ්ඩායමක් ඉතා උනන්දුවෙන් ක්‍රියා කරමින් සිටී. කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ පළවෙන්නාවූ සෑම පණිවිඩයක්ම ප්‍රථමයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ලියා ඉන් පසුව එය භාෂා 15 කට අදාල පුද්ගලයින් තුළින් පරිවර්තනය කරනු ලබයි.



අපගේ මාස්පතා එවනු ලබන සඟරා සියල්ලම මුද්‍රණය කර එය නිසි ක්‍රමයට නම්, තැපැල් කාර්යාලයේ නීති රීති වලට අනුකූලව ඒ ඒ දිනයන්හිදී තැපැල් කරනු ලබයි. මෙවැනි සේවයෙහි යෙදී සිටින්නාවූ මෙම 75 දෙනා ගැන කරුණාකර යාච්ඤා කරන්න. මෙම සේවයට ඔබත් පංගුකාරයෙකු වීමට ඔබගේ සම්පූර්ණ සහයෝගය අපට දෙන්න.

අපගේ සේවය උදෙසා යාච්ඤා කරන්නාවූ යාච්ඤා හවුල්කාරයින්, සෑම මාසයකදීම නිකුත්කරන්නාවූ මෙම සඟරාවේ අදහස් අප අතර හුවමාරු කරන්නාවූ සම්බන්ධකාරක සේවකයින් අපට අවශ්‍යව ඇත. මේ සඳහා ඔබගේ ප්‍රතිචාරයන් අපි බලාපොරොතු වෙමු. මෙම ලිපිය ඉතා ඉවසීමෙන් යුතුව කියවීම ගැන අපගේ ස්තුතිය පුද කරමි. ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

දෙවියන්වහන්සේගේ සමාදානය ඔබ සමඟ පවතීවා ආමේන්....

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

පාස්ටර් සෑම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සෑම්සන් සෑම්

(+91) 98412 71858 / 98410 71858,
E.mail : samselvaraj333@gmail.com

*1 පිටුවෙන්....*

කරයි. නමුත් ඇය මුහුණ දෙන මෙම කරදර නිසා ඇය අසනීප තත්වයෙන්ද පසු වෙයි. ඇය නිතරම, ''ස්වාමිනී, මේවා මට දරා ගැනීමට බැහැ. මා ඉදිරියට යන්නේ කෙසේද? මේ කරදර මාව විනාශ කරයි.''

තවත් කාන්තාවක් මෙසේ ලියා තිබුණි. ''පසුගිය වසර 7 ක් පුරාවටම මා බොහෝ ප්‍රශ්න සමඟ ජීවත් වුවෙමි. මාගේ ස්වාමී පුරුෂයාගේ සෞඛ්‍යය තත්වය ඉතාම අයහපත්ව ඇත. අපගේ ආර්ථික ප්‍රශ්න ඉතාම දරුණුව ඇත. වයස අවුරුදු 89 ක් ව සිටින පියාද පිළිකා රෝගයෙන් පෙළෙයි. කරුණාකර අප උදෙසා යාච්ඤා කරන්න'' යනුවෙනි.

මෙම කාන්තාවට දිනපතාම වේදනාවෙන් සිටින පියාද, අසනීප තත්වයෙන් සිටින්නාවූ ස්වාමි පුරුෂයාද ශාරීරික වේදනාවෙන්ද හා ආර්ථික ප්‍රශ්න වලටද මුහුණ දීමට සිදුවී තිබේ. ස්වාමිනී මගේ සතුරා මට විරුද්ධව ඉතාම බලසම්පන්න ලෙස ක්‍රියා කරයි. මා වැනි දුර්වල කෙනෙක් මේවාට මුහුණ දෙන්නේ කෙසේද? මට උපකාරයක් නැද්ද'' කියා හඬනවා ඇත. මෙලෙස ඇය කීප වතාවක්ම කියන්නට ඇත්දැයි කියා මා නොදනිමි.

එක්තරා පාලකවරයෙකුගේ ලිපියෙහි මෙසේ ලියා තිබුණි. ජූලි මාසයේදී මා පිළිකා ශෛල්‍යකර්මයකට භාජනය වූයෙමි. දැන් මට දියවැඩියාවද තිබේ. මගේ අසනීප තත්වය නිසා මා ඉතා වේදනා තත්වයෙන් සිටිමි. මා ගැන යාච්ඤා කරන්න.

මේ දේවගැතිවරයා හැමදාම හතුරාගේ පහරකෑම් වලට මුහුණදෙයි. ඔහු ඉතා වේදනා සහිත ජීවිතයක් ගතකරයි. ඔහුගේ දියවැඩියා තත්වයට විරුද්ධව සටන් කිරීමට ඔහුට සිදු වී තිබේ. ''මේ ආකාරයෙන් මා ජීවත් වෙන්නේ කොහොමද? මම ඉදිරියට යන්නේ කොහොමද? කියා ඔහු අසනවා ඇත.

තවත් මහළු මවක් මෙසේ ලියා තිබුණි. ''මට වයස අවුරුදු 81 කි. මා ආතරයිටිස් හා දියවැඩියාව රෝගයෙන් පෙළෙයි. මගේ කොඳු ඇට පෙළ සහ පාදය ඉතාම දුර්වලයි මට ඇවිදීමට ඉතාම අමාරුයි. මගේ නිවසේ සියලුම වැඩද මා විසින්ම කල යුතුයි. මට එතරම් මුදල්ද නැත. කිසිම ඥාතියෙක්ද මට නොමැත. කරුණාකර මා උදෙසා යාච්ඤා කරන්න.

මෙලෙස වේදනාවෙන් සිටින්නාවූ කාන්තාවට තමාගේ කෑම ටික සපයා ගැනීමටවත් නොහැකිව දුක්වන බවක් මට පෙනෙයි. ඇයට උපකාර කිරීමට කිසිවෙක්ද නැත. ''තවත් දිනකට මා මුහුණ දෙනු ලබන්නේ කෙසේද? මට ඇඳන් බැසීමට බැරිවූ විටදී මට සිදුවන්නේ කුමක්ද? කියා ඇය සිතනවා ඇත.

තවත් සහෝදරියක් මෙසේ ලියා තිබුණි. ''මගේ ස්වාමි පුරුෂයාගෙන් මට ලිපියක් ලැබුණ අතර එහි ඔහුගේ පිළිකා තත්වය දරුණු අතට පත් වී ඇති බව සඳහන් කර තිබුණි. ඔහු දේව භය ඇති ඉතා අනර්ඝවූ ස්වාමි පුරුෂයෙකි. මගේ අවුරුදු 14 ක වයසැති පුතාට හොඳ පියෙකි. කරුණාකර අපගේ ඇදහිල්ල තුළ ශක්තිමත්ව සිටින්නය කියා යාච්ඤා කරන්න.''

මේ ආකාරයට පැමිණි ලිපි දෙස බලන විටදී ඒ සෑම කෙනෙක්ම ඔවුන්ගේ ජීවිත වල විවිධ ප්‍රශ්න සමඟ ගැටෙන ආකාරයක් අපට දැකීමට හැකිය. දිනපතාම ඔවුන්ගේ ජීවිත වලට පැමිණෙන්නාවූ ප්‍රශ්න වලට ඔවුන් ඉතා සටන්කාමී ලෙස මුහුණ දෙන බවක් පෙනී යයි. මගේ ජීවිත කාලයේදී වර්ථමානයේ කිතුණුවන් මුහුණ දෙනු ලබන ප්‍රශ්න, කරදර, වේදනකාරී තත්වයන් ගැන

අසා ඇත. අද කිතුණුවන්ගේ විවාහය සටන් ඇත. ආර්ථික ප්‍රශ්න, ශාරීරික දුර්වලතාවයන්ගෙන් පෙලෙනවා ඇත. ''මේ සෑම දේ තුලින්ම මා ජය ගන්නේ කෙසේද? සතුරාගේ මේ සියලුම ක්‍රියා ඉතා බලසම්පන්නයි. ඒවා ඉදිරියේ මා ඉතාම දුර්වලයි. මෙයින් ජය ගැනීමට මට කිසිම දෙයක් කිරීමට බැහැ. ස්වාමිනී, මා මෙසේ ඉදිරියට යන්නේ කෙසේද? කියා මිනිසුන් අසනවා ඇත.

සත්‍ය නම්, මෙවැනි දරුණු වූ දේ දෙවියන්වහන්සේට පුදුම දෙයක් නොවෙයි. මේ සෑම දේ තුළින් ප්‍රශ්න වලට මුහුණ දෙන්නේ කෙසේ කියා දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයෙන් අපට මාර්ගයක් පෙන්වා දෙනවා ඇත.

දෙවියන්වහන්සේ මෝසෙස්ට බලාපොරොත්තුවේ වචන දෙකක් දුන්නේය. අද අප විසින් එම දෙයම කරනවා නම් අපටද ශුභසිද්ධ වනු ඇත. උන්වහන්සේ අපගේ පරීක්ෂාවන් වලදී අපට මගපෙන්වනවා පමණක් නොව උන්වහන්සේගේ පොරොන්දු ඉෂ්ඨ කිරීමටද උන්වහන්සේ විශ්වාසවන්තව සිටින සේක.

## (1). අපගේ සතුරන්ට භිය නොවන්නය කියා ස්වාමීන්වහන්සේ අපට අණ කරයි.

***''ඔවුන්ට භිය නොවන්න...'' (ද්විතීය කථාව 7:17-18)*** දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට පවසනු ලැබුයේ, ඔවුන් පොරොන්දු දේශයට ගමන්කරන විටදී හමුවන කිසිම අන්‍ය ජාතිකයින්ටවත් බලසම්පන්නවූ කිසිම මනුෂ්‍යයෙකුටවත් භය නොවන්න කියාය. අද දෙවියන්වහන්සේ අපටද පවසනු ලබන්නේ, අපගේ ජීවිතයට පැමිණෙන අප මුහුණ දෙනු ලබන සෑම ප්‍රශ්න, හා කරදර වලට භිය නොවන ලෙසයි.

සමහර විටදී, ''අප භය නොවිය යුත්තේ ඇයි?'' ඔබ අසනවා විය හැක. නමුත් ඒ පිළිබඳව අපට ප්‍රශ්න කිරීමට නොහැකිය. මන්ද එය ''භය නොවන්න'' ය කියා පවසනු ලබන්නේ දෙවියන්වහන්සේය. දෙවියන්වහන්සේ බලසම්පන්නයි. අප මුහුණ දෙනු ලබන්නාවූ යක්ෂයාගේ සෑම ක්‍රියාවක් පිළිබඳවම උන්වහන්සේ දනී. හැම මලපතක් ගැනම උන්වහන්සේ දනී. යක්ෂයා අපට ගෙනෙන සෑම පරීක්ෂාවක් ගැනම දනී. දෙවියන්වහන්සේ අපට දෙන්නාවූ හඬ නම්, ''භය නොවන්න.'' කියාය.

දෙවියන්වහන්සේ මෙම ආඥාව ආබ්‍රහම්ට දෙනු ලැබීය. තමා නොදන්නාවූ දේශ්‍ය ආබ්‍රහම් ජීවත් වූ බව අපට පෙනෙයි. එම දේශයෙහි බලසම්පන්න වූ රජවරුඑහි සිටිය නමුත් දෙවියන්වහන්සේගේ වචනයෙහි ඔහුට මෙසේ පවසා තිබේ. ***''....ආබ්‍රහම් භය නොවෙන්න, නුඹේ පලිහද නුඹේ ඉතා මහත් විපාකයද මමය...'' (උත්පත්ති 15:1)***

මෙහි තේරුම නම්, මා නුඹ වටා තිබෙන්නාවූ පවුරක් වෙමි. නුඹව ආරක්ෂා කරන්නාවූ තැනැන්වහන්සේය. තවද දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට පවසනු ලැබුයේ නුඹ බොහෝ ප්‍රශ්න වලට මුහුණ දීමට යන නමුත් මා නුඹව එයින් ආරක්ෂා කරමි.'' ආබ්‍රහම් දෙවියන්වහන්සේගේ හඬ විශ්වාස කලේය. ***''ඔහු ස්වාමීන්වහන්සේ විශ්වාසකලේය. උන්වහන්සේ ඒක ඔහු සඳහා ධර්මිශ්ඨකමකොට ගණන්ගත්සේක.''(උත්පත්ති 15:6)***

මෙම වචනය නම්, ආබ්‍රහම්ගේ පුත්‍රවූ ඊසාක් වෙතටද පැමිණුනේය. ඔහු වටාද පිලිස්තිවරු සිටි අතර ඔහුට වෛර කලාවූ ඔහුට කරදර කලාවූ දේශයක ජීවත් විය. ඊසාක් ළිං හෑරූ සෑම අවස්ථාවකදීම පිලිස්තිවරු පැමිණ එම සෑම ළිඳක්ම වසා දැමූ බව දේව වචනයෙහි සඳහන් කර ඇත. ***''....ඔහුගේ පියාගේ වැඩකාරයන් විසින් හෑරූ සියලු ළිං පිලිස්තිවරුන් විසින් පස් පුරවා වසා දමා තිබුණේය.'' (උත්පත්ති 26:15)***

ඊසාක් ගමන් කලාවූ සෑම ස්ථානයකදීම ඔහුට මෙම ප්‍රශ්නයට මුහුණදීමට සිදුවිය. ඔහු ළිඳක් හාරා එයට ''එසෙක්'' යන නම තැබීය. එහි තේරුම නම්, ''තරඟය හෝ විවාදයයි''. ඔහු ගමන් කලාවූ සෑම ස්ථානයකටම පිලිස්තිවරුන් විවාද කිරීමට පැමිණුනේය. හම නිසා ඊසාක් මෙසේ සිතන්නට ඇත. එනම් ''මගේ පවුලට මා කන්න දෙන්නේ කොහොමද? මගේ ගවයන්ට වතුර දෙන්නේ කොහොමද? මගේ දරුවන්ට හදාගන්නේ කොහොමද? පිලිස්තිවරුන් කුමන අවස්ථාවකදී හෝ පැමිණ අපව මරා දමනවා ඇත. ස්වාමීන්වහන්සේ මාව මෙතනට ගෙන ආවේ කෙසේද? මම සාර්ථක වෙන්නේ කොහොමද?

මෙවැනිම වූ සැකයක් ඊසාක්ටද පැමිණුනේය. එම නිසා දෙවියන්වහන්සේ ඊසාක්ට කථාකර ආබ්‍රහම්ට දුන්නාවූ පොරොන්දුවම ඔහුටත් ලබා දුන්නේය. ***''...මම නුඹේ පියවූ ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේයි. භය නොවන්න. මක්නිසාදනුඹ සමඟ සිටිමි. මම නුඹට ආශිර්වාද කර මාගේ මෙහෙකරුවූ ආබ්‍රහම් නිසා නුඹේ වංශය වැඩි කරන්නෙමි.''(උත්පත්ති 26:24)***

අද ඊසාක් මෙන් අපද ආබ්‍රහම්ගේ දරුවෝය. ස්වාමීන්වහන්සේ එම පොරොන්දුවම අපට දෙනු ලබයි. ***''ඉදින් නුඹලා ක්‍රිස්තුස්හන්සේගේ නම්, නුඹලා ආබ්‍රහම්ගේ වංශයද පොරොන්දුවූ ලෙස උරුමක්කාරයෝද වන්නහුය.'' (ගලාති 26:29)*** ආබ්‍රහම් සේවය කලාවූ දෙවියන්වහන්සේට අපිත් සේවය කරමු. උන්වහන්සේ අපගේ පලිහත් රක්ෂස්ථානයත් ය.

*6 වෙනි පිටුවට....*


**NEHEMIAH BIBLE**

**RESIDENTIAL / EVENING COLLEGE,**

Velachery / Chepauk & Santhoshapuram, Chennai.

Medium : Hindi / Tamil

*Registered Candidate for Membership*

Asia Theological Association (ATA)

Recognised by International Christian Leaders & Senior Pastors for the past 54 years

Diploma in Ministry : One year
Diploma in Theology : Two years
Bachelor of Theology : Three years

Qualification : 10th Standard & above

**Rush for admission!**

**Contact : The Chairman, Nehemiah Bible College.**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org

✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**සැප්:19-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ 55 වන සංවත්සරයට ආශිර්වාද කල දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:20-** භාෂා 16 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:21-** යාච්ඤා මැදිහත්කරුවන්, මහාආඥාවේ මැදිහත්කරුවන් ඇතුළු අනෙක් සේවකයන් සහ ඔවුන්ගේපවුල් වල අයට ස්වාමීන්වහන්සේගේ කරුණාව ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:22-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සියලුම සේවකයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:23-** U Tube සමාජ මාධ්‍ය ජාලය තුළින් ක්‍රියාත්මක වන කැඳවීමේ ප්‍රතිරාවය විනාඩි 5 වැඩසටහන ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:24-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලට නෙහෙමියා බයිබල් විදුහලට සහ දේවධාර්මික අධ්‍යනය සේවයට දෙවිඳුන්ගේ ආශිර්වාද ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:25-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයට නව සම්බන්ධීවරයෙකු ලැබෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:26-** දේව සේවකයන්ගේ කැපවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:27-** කැඳවීමේ ප්‍රතිරාවය මුද්‍රණාලයේ අඛණ්ඩ පැවැත්ම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:28-** නෙහෙමියා බයිබල් විදුහලට නවක සිසුන් ලැබෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:29-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සෑම පාඨමාලාවන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:30-** නෙහෙමියා බයිබල් විදුහලට අවශ්‍ය සනීපාරක්ෂක කටයුතු ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:01-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයට නව සහකාර කතෘ වරුන් ලැබෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:02-** ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවලදෙවියන්වහන්සේගේ වචනය බලවත් වන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**ඔක්:03-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ බලවත් දේව සේවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ඔක්:04-** ගැලවීම නොලැබූ සෙනඟ වෙත ළඟාවීම පිනිස යාච්ඤා කරන්න

**ඔක්:05-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය සාතනික මලපත් වලින් ආරක්ෂා වෙන පිනිස යාච්ඤා කරන්න

**ඔක්:06-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සියලුරුම සේවක පිරිස ආරක්ෂා වීම පිනිස යාච්ඤා කරන්න

**ඔක්:07-** නෙහෙමියා බයිබල් විදුහලේ සිසුන්ගේ ආරක්ෂාව ගැන යාච්ඤා කරන්න

**ඔක්:08-** සේවයේ සියලුම අවශ්‍යතා ගැන යාච්ඤා කරන්න

**ඔක්:09-** ලෝක ව්‍යාප්ත සුභාරංචි සේවය උදෙසා මූල්‍යමය වියදම් ගැන යාච්ඤා කරන්න

**ඔක්:10-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ ජීවිත කථාව ලිවීම ධෛර්යමත් වන පිනිස යාච්ඤා කරන්න

**ඔක්:11-** ලෝක සාමය උදෙසා යාච්ඤා කරන්න

**ඔක්:12-** ලෝකයේ සෑම තැනකම සේවය කරන කිතුණු සේවකයන් ගැන යාච්ඤා කරන්න

**ඔක්:13-** මනිපූර් ප්‍රදේශය ඇතුළු ඉන්දියාවේ ප්‍රාන්ත උදෙසා යාච්ඤා කරන්න

**ඔක්:14-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ, ඉංග්‍රීසි සේවයේ සහකාර කතෘ රිචඩ් සැමුවෙල් සහ සහෝදරී ස්වර්තා යන දෙදෙනාගේ ඉක්මන් සුවය ගැන යාච්ඤා කරන්න

**ඔක්:15-** ආර්ථික වැටීමට ලක්වී ඇති ප්‍රදේශ ගැන යාච්ඤා කරන්න

**ඔක්:16-** ස්වභාවික විපත්ති වලින් ලෝකයේ ජනතාව ආරක්ෂා වන පිනිස යාච්ඤා කරන්න

**ඔක්:17-** ලෝකයේ සෑම රටකටම දේව භයැති නායකයින් පත්වන පිනිස යාච්ඤා කරන්න

**ඔක්:18-** අන් මනුෂ්‍යයන් විසින් පාගා දමා සිටින දිළිඳු මනුෂ්‍යයන් ගැන යාච්ඤා කරන්න

4 පිටුවෙන්....

අපගේ ස්වර්ගීය පියාණන්වහන්සේ අපගේ ජීවිතයේ සියලුම පියවරුන් දන්නා සේක. අපගේ සෑම අමාරුකම් හා ප්‍රශ්න තුලදී නැවත නැවත ස්වාමීන්වහන්සේ අපට පවසන්නාවූ කාරණය නම්, දේව වචනය තුල ''හිය නොවන්න'' කියාය. අපගේ සෑම අමාරුකම් හා ප්‍රශ්න තුලදී දෙවියන්වහන්සේ අපට දෙවියන්වහන්සේ වචනය තුළින් නැවත නැවත ප්‍රකාශ කරනු ලබන්නේ ''හිය නොවන්න'' යනුවෙනි. අපගේ ප්‍රශ්න අපව විනාශ කර අපව බිමට වට්ටයි කියා නොසිතා ස්වාමීන්වහන්සේ අපගේ පලිහ කියා සිතා නිර්භීතව යා යුතුයි.

***''එම්බා ඉශ්‍රායෙල් නුඹ වාසනාවන්තය, ස්වාමීන්වහන්සේ විසින් මුදන ලද සෙනඟක්වූ නුඹට සමාන කවුද? උන්වහන්සේ නුඹට උපකාර කරන පලිහත් නුඹේ මහිමයේ කඩුවත්ය. නුඹේ සතුරෝ නුඹට යටත්වෙන්නෝය. නුඹද ඔවුන්ගේ උසස්ථාන පාගන්නෙහිය.'' (ද්වීතීය කථාව 33:29)*** දෙවියන්වහන්සේ අපට පවසන්නේ, ''ඔබව මා අමතක කලා කියන එක බොරුවක්ය. සතුරා, නුඹට විරුද්ධව මා අත් හැරියා කියන එකද බොරුවක්ය. මෙය සතුරා ඔබට දමන මායාවකි.

**කිතුණුවන්ට නිතරම පීඩා කරන්නාවූ, පාපය සමඟ සටන්කරන්නාවූ කාරණය ගැන පැවසීම කැමැත්තෙමි.**

ඔබ උදෑසන අවධි වන විටදී කාමිශ්‍ය ආශාවන්ගෙන් කරදර කරන්නාවූ පාපය සමඟ නැගිටිනවාද? සමහර විට මෙවැනි කාමිශ්‍ය පාපය නිතරම මා තුළ තිබෙනවාය කියා ඔබ සිතනවාද?

ඔබගේ හදවත තුළ තිබෙන්නාවූ සියලුම පාප උන්වහන්සේ දනී. එයට ඔබ කොතරම් වෛර කරනවාද? එයින් ඔබ ජයගැනීමට උත්සහ කරන ආකාරයත් උන්වහන්සේ දනී. උන්වහන්සේගේ වචනයට ඇහුම්කන් දෙනවාට උන්වහන්සේ කැමතියි. ''භය නොවන්න. මම ඔබගේ පලිහ හා ආරක්ෂාවයි. සතුරාගේ සෑම දෙයකටම විරුද්ධව ක්‍රියා කරන්නාවූ ශුද්ධකමේ කඩුවයි. ඔබට ඔබගේ පරීක්ෂාවෙන් ජය ගැනීමට මා ඔබට උගන්වමි.''

මේ දේ ගැන දාවිත් ඉතා හොඳින් දැනගෙන සිටියෝය. එනිසා දාවිත් පවසන්නේ නපුරට මා හිය නොවෙමි කියාය. ***(ගීතාවලිය 23:4)*** ඔහු භය වුවහොත් යක්ෂයා ජයගන්න බව ඔහු දැන සිටියෝය.

ඔබ ඔබගේ පාපය ගැන භයෙන් සිටිනවාට යක්ෂයා කැමතියි. ඔබ ඔබගේ පාපය ගැන භයෙන් සිටිනවාටත් මට එයින් කිසිම නිදහස් වීමක් නැත කියන භයෙන්ම සිටිනවාට යක්ෂයා කැමතියි. නමුත් මෙලෙස දුක් විඳින්නාවූ ශුද්ධවන්තියන්ට දෙවියන්වහන්සේ පවසන්නාවූ දෙය නම්, ''භය නොවන්න, මම ඔබගේ සෑම වේදනාකාරී සියල්ලම දක්නෙමි. කිසිසේත්ම යක්ෂයාට ඔබව විනාශ කිරීමට ඉඩ නොදෙමි.

නමුත් ''මා කරන්නට යන්නේ මොනවාද? මේ හැම දේ තුලින්ම දෙවියන්වහන්සේගේ සමාදානය හා සැපයීම මට ලැබෙන්නේ කොහොමද?'' කියා ඔබ ඇසීමට පුළුවන.

මේ පිළිබඳව දෙවියන්වහන්සේ දේව වචනය තුල මෙසේ සඳහන් කර ඇත. ඉශ්‍රායෙල් සෙනඟ හා මෝසෙස් ඉදිරියෙහි රතු මුහුදද ඔවුන් පිටුපස සතුරා පැන්නු බැවින් නැවත හැරීමටද ඔවුන්ට කිසිම ස්ථානයක් නොතිබූ අවස්ථාවේදී දෙවියන්වහන්සේ ඔවුන්ට මෙසේ පවසනු ලැබීය. ***''භය නොවෙල්ලා, නිශ්චලව සිට ස්වාමීන්වහන්සේ අද නුඹලාට සිදුකර දෙන ගැලවීම බලාපල්ලා. මක්නිසාද නුඹලා අද දුටු මිසරවරුන් නැවත තවත් කවදාවත් නොදක්නහුය. ස්වාමීන්වහන්සේ නුඹලා උදෙසා සටන් කරන සේක. නුඹලා නිශ්ශබ්දව සිටිය යුතුයි.'' (නික්මයාම 14:13-14)***

නුඹලා නිශ්ශබ්දව සිටිය යුතුයි කියා පවසන්නාවූ දෙයහි තේරුම කුමක්ද? එනම්, කිසි දෙයක් ගැන කනස්සල්ලට පත්වෙන්න එපා. ඔබගේම නුවණින් ඔබ ක්‍රියා කරන්න එපා ප්‍රශ්නය දෙවියන්වහන්සේට භාර දී නිශ්චලව සිටින්න. ඉදිරියට යන්න. ***''...ඉදිරියට යන්න.'' (නික්මයාම 14:15)***

යෝෂුවා තම ජීවිතය තුල සතුරාගේ අමාරුකම් වලට මුහුණ දුන්නේය. රජවරුන් පස්දෙනෙක් ඔහුට විරුද්ධව පැමිණි විටදී ගිබියොන් යන ස්ථානයෙහි මුළු රාත්‍රියම ගත කිරීමට සිදුවිය. යෝෂුවා සටන්කාමී ස්ථානය දුටු විට එම මුළු මිටියාවතම සොල්දාදුවන්ගෙන් පිරී තිබුණ බව දුටුවෙමි.

එවැනි අවස්ථාවේදී යෝෂුවා මෙලෙස සිතන්නට ඇත. ''අනේ ස්වාමිනී, අප ළඟ සිටින්නේ නටයන් ටික දෙනයි. අප මෙවැනි බලවත් සේනාවකට විරුද්ධව සටන් කිරීමට ඕනි. කරුණාකර අප කුමක් කල යුතුද? කියා පැවසුව මැනව.''

***''ඔවුන්ට භය නොවෙන්න, මක්නිසාද මා විසින් ඔවුන් නුඹ අතට පාවා දී තිබේ, ඔවුන්ගෙන් කිසිවෙක්වත් නුඹ ඉදිරියේ නොසිටින්නේයයි කීසේක.'' (යෝෂුවා 10:8)***

යෝෂුවා යුද්ධයට යාමට පෙර දෙවියන්වහන්සේ ඔහුට ජයග්‍රහණය ප්‍රකාශ කලේය. උන්වහන්සේ පවසනු ලැබුයේ, ''සටන ජයගන්න. මේ සොල්දාදුවන්ගෙන් කිසිවෙක්වත් නුඹට විරුද්ධව එන්නට බැහැ. මා දුන් පොරොන්දුව හා ජයග්‍රහණය අල්ලාගෙන සටන් කරන්න.

මෙයයි කල්වාරි කුරුසියේ පණිවිඩය, උන්වහන්සේ අපගේ ජීවිතයට ජයග්‍රහණය ලබා දී හමාරය. අප මුහුණදෙන්නාවූ ප්‍රශ්නකාරී තත්වය අමාරු කාරණාවන් අප ඉදිරියෙහි තිබුණත් අප ඉදිරියෙහි තිබෙන්නේ ස්වාමීන්වහන්සේගේ ජයග්‍රහණය පමණකි. ***''නමුත් අපට ප්‍රේමකලාවූ තැනැන්වහන්සේ කරණකොටගෙන අපි මේ සියල්ලේදී අතිශයින්ම ජයගන්නෝ වමුව'' (රෝම 8:37)***

මෙයින් පැහැදිලි වන්නේ අප කිසිවක් නොකල යුතුයි කියාද? අපගේ සතුරන්ව විනාශ කිරීමට දෙවියන්වහන්සේ තම දූතයන්ව එවන්නේද? නැත. දෙවියන්වහන්සේ අපගේ ජයග්‍රහණය ප්‍රකාශකර තිබුණත් අපගේ කොටස ඉටුකල යුතුයි කියා උන්වහන්සේ බලාපොරොත්තු වෙයි. අප උදෙසා අපගේ කොටස උන්වහන්සේ ඉටු නොකරයි. ***''ඒ සියල්ල ඇර, ඇදහිල්ල නමැති පලිහ අරගනිල්ලා එයින් නපුරාගේ සියලු ගිනිහෙල්ල නිවන්ට නුඹලාට පුළුවන්වන්නේය. ගැළවීම නමැති ආරක්ෂා තොප්පියද දෙවියන්වහන්සේගේ වචනය නමැති ආත්මයාණන්වහන්සේගේ කඩුවද ගනිල්ලා.'' (එපීස 6:16-17)***

අප සතුරාට විරුද්ධව සටන් කරනු පිණිස කඩුව අතට ගත යුතුය. දෙවියන්වහන්සේ අපට පැවසූ දෙය අප විශ්වාස කරමින් අප නිර්භීතව ඉදිරියටම යා යුතුය. ***"නුමුත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන අපට ජය දෙන්නාවූ දෙවියන්වහන්සේට ස්තුති වේවා." (1 කොරින්ති 15:57)***

අප ස්වාමීන්වහන්සේට කන්නලව් කරන විටදී උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්වහන්සේට අප වෙතට පැමිණ උන්වහන්සේගේ සර්ව බලය අප වෙතට දී අපගේ ඇදහිල්ලෙන් ජය ගැනීමට උපකාර කරනු ඇත. අපගේ කොටස ඇදහිල්ලෙන් දෙවියන්වහන්සේව විශ්වාස කරමින් උන්වහන්සේ සමඟ ගමන්කරනු ලැබීමයි. ශුද්ධාත්මයාණන්වහන්සේ සියලු නපුරු බලවේග වලට විරුද්ධව ක්‍රියා කරයි.

## 2. අතීතයේදී ස්වාමීන්වහන්සේ අපගේ සතුරන්ව පරාජය කල ආකාරය සිහිකරන්නය කියා දෙවියන්වහන්සේ අණ කරයි.

මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟට මෙවැනි දැනමුතුකමක් දුන්නේය. ***"ඔවුන්ට භය නොවෙන්න. නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ පාරාවෝ සහ මුළු මිසරට කල දේද නුඹේ ඇස්වලින් දුටු මහත් පරීක්ෂණද ලකුණුද ආශ්චර්යයන්ද නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹ පිටතට ගෙනාවාවූ ඒ බලසම්පන්න හස්තය හා දිගුකල බාහුවද මනාකොට සිහිකරගනින්න. නුඹ භය වෙන්නාවූ සියලුම ජනයන්ට නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ එසේම කරනවා ඇත." (ද්විතීය කථාව 7:18-19)***

මෙය කෙතරම් බලවත්වූ පණිවිඩයක්ද? මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟට මෙලෙස මතක්කර දෙයි. ඔබ මුණදෙන්නාවූ සතුරා කොතරම් බලවත් වූවත් කමක් නැත. දෙවියන්වහන්සේ එයින් ජයග්‍රහණය දෙන බව විශ්වාස කරන්න. උන්වහන්සේ නුඹලාගේ මුල් පියවරුන්ට ජයග්‍රහණය ලබා දුන්නාක් මෙන් උන්වහන්සේ ඔබ මුහුණදෙනු ලබන්නාවූ සියලු අභියෝගාත්මක සටන් වලදී උන්වහන්සේ ඔබට ජයග්‍රහණය ගෙන දෙනු ලබයි. ***"නුඹ මිසර දේශයෙන් පිටතට ආ දවස නුඹේ ජීවිතයේ සියලු දවස්හි සිහිකරන පිණිස...." (ද්විතීය කථාව 16:3) "නුඹ මිසරයෙහි වහලෙක්ව සිටි බව සිහිකරමින්, මේ පනත් රක්ෂාකරන්ට බලාගනින්න." (ද්විතීය කථාව 16:12)***

මෝසෙස් සෙනඟට හඬනගා පවසනු ලැබුයේ, නුඹලාගේ අතීතය සිහි කරන්න. නුඹලා මෙම කාන්තාරයෙහි අමාරුකම් තිබුණාය කියා සිතුවා නම්, මිසරයේ නුඹලාගේ පියවරුන් වින්ද දුකේදී ස්වාමීන්වහන්සේ කල දේ සිහිකරන්න. ඔබ වහල්කමෙන් සිටිය විටදී උන්වහන්සේ ඔබව මුදවාගත් ආකාරය සිහි කරන්න.

යෙසායා අනාගතවක්තෘ භයෙන් සිටි සෙනඟට කථාකර මෙසේ පවසනු ලැබීය. එනම්, ඉශ්‍රායෙල් සෙනඟ ඔවුන්ගේ දෙවියන්වහන්සේව අමතක කර දමා සිටියාද? ඔවුන් භයෙන් හතුරා යටතේ සිටිය නමුත් යෙසායා ඔවුන්ට දුන් පණිවිඩය නම්,

***"නුඹලා සනසන්නේ මමමය. නැසීයන මනුෂ්‍යයාටත් තෘණ මෙන් පහවයන මනුෂ්‍ය පුත්‍රයාටත් භයවෙන්ටද නුඹේ මැවුම්කාරවූ, අහස දිග ඇරියාවූ, පොළොව පිහිටෙව්වාවූ, ස්වාමීන්වහන්සේ සිහිනැතිකොට, විනාශ කිරීමට පීඩාකාරයා සූදානම්වෙන විට, ඔහුගේ කෝපය නිසා නිතරම දවස මුළුල්ලෙහි වෙවුලන්ටද නුඹ කවුද? පීඩාකාරයාගේ කෝපය කොතැනද?" (යෙසායා 51:12-13)***

මෙම අනාගතවක්තෘට දෙවියන්වහන්සේ පවසනු ලැබුයේ, "ඔබ අද භයෙන් සිටින්නේ මම කවුද? කියා ඔබ අමතක කල නිසාය. ඔබ ඔබගේ ප්‍රශ්නය දෙස පමණක් බලන නිසා මාගේ හස්තය තුළින් ඔබගේ ජීවිත තුල බලවත්වූ දේ කරන බව අමතක කර දමා ඇත. මාගේ හස්තය නුඹලාගේ ජීවිත කෙරෙහි තවත් තිබෙන බව ඔබ අමතක කර ඇත.

ඔබත් ඔබගේ කරදර හා පීඩා වලදී භයවී සිටියේ ස්වාමීන්වහන්සේ ඔබට අතීතයේදී කල සියල්ලම ඔබ අමතක කර දමා තිබෙන නිසාය. ඔබ දේව වචනය විශ්වාස කරන්න. දේව වචනය නිතරම යේසුස් වහන්සේ කල පූජාව ගැන මතක්කර දෙයි. අප කල්වාරි කුරුසියේ යේසුස් වහන්සේ ලබාදුන් ජයග්‍රහණය ලබාගෙන එය අත්පත් කරගත යුතුය. එවිට උන්වහන්සේ අපව බලයෙන් පූර්ණ කරනු ඇත.

*9 වෙනි පිටුවට....*

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**"...කියවන්නා තේරුම් ගනීවා...."** (මතෙව් 24:15)

## සුදු දිගු රැවුලක් සහිත අලංකාර මනුෂ්‍යයා

*"ස්වාමීන්වහන්සේගේ දූතයා ඔහුට පෙනී, ධෛර්‍යමත් බලවත් මුනෂ්‍යය, ස්වාමීන්වහන්සේ නුඹ සමඟ සිටිනසේක." (විනිශ්චයකාරයා 6:12))*

## HANDSOME MAN WITH LONG BEARD!

චෙන්නෙයි නුවර අක්බාර් සාහිබ් වීදියේ තිබෙන්නාවූ මාගේ කුලියට ගත් නිවසේහි වැඩි ඉඩ ප්‍රමාණයක් අපගේ සභා සේවය උදෙසා පාවිච්චි කලෙමි. අපගේ අසල්වාසී සියලු දෙනාම මුස්ලිම් සහෝදර සහෝදරියන්ය. ඔවුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචි සේවයට කැමැත්තක් දැක්වූයේ නැත. නමුත් දෙවියන්වහන්සේ මේ පලාතෙහිම මාගේ සේවය ඉදිරියට කරගෙන යන පිණිස පෙළඹුවේය.

මාගේ අනෙකුත් ශුභාරංචි සේවාවන් සමඟ මාගේ පුද්ගලික ශුභාරංචි සේවයද මා කරගෙන ආවෙමි. සෑම ඉරුදිනකම උදෑසන 9.00 ට දේව මෙහෙය පැවැත්වුයෙමි. මේ දේව මෙහෙයන් වලදී මා එකෝඩියම් සංගීත භාණ්ඩය වාදනය කරමින් නමස්කාර කලෙමි. මෙම ශබ්දයට අසල්වාසී කිසිවෙක් කැමති වූයේ නැත. පළමු වසර කීපය තුලදී, සභාවට පැමිණි සෙනඟ සංඛ්‍යාව බොහෝ ස්වල්පයකි.

1984 වන වසරේදී ඉරුදින උදෑසන දේව මෙහෙය ආරම්භ කිරීමට මා සූදානමින් සිටි අවස්ථාවේදී මා යාච්ඤා කරමින් ස්වාමීන්වහන්සේ, මට ආත්ම දෙන්න කියා පවසමින් උන්වහන්සේගේ අභිමුඛත්වය තුළ බලා සිටියෙමි. එම දිනදී එක් පුද්ගලයෙක්වත් ආවේ නැත. මා ශාරීරිකව වෙහෙසට පත් විය. සිත කැඩුනාවූ පුද්ගලයෙකු ලෙස අනෙක් පස තිබූ කාමරයට ගොස් මා හාන්සිවූයෙමි.

එම අස්ථාවේදී මා දර්ශනයක් දුටුවෙමි. දිගු රැවුලක් ඉතා අලංකාර වූ පුද්ගලයෙක් මා දේව මෙහෙය පවත්වන්නාවූ ස්ථානයට පැමිණුනේය. තවත් කීප දෙනෙක් ඔවුන් සමඟ දේවස්ථානයට ඇතුල් වූවේය. ඔවුන්ගේ මුහුණ කිසිවක් මට පැහැලදිලිව පෙනුනේ නැත. මෙම ලස්සන මනුෂ්‍යයා ඔහු සමඟ පැමිණි මෙම සෙනඟද සමඟ පැමිණ දේවස්ථානයේ විදුලි පංකා සහ විදුලි පහන්ද ක්‍රියාත්මක කර දණගසා යාච්ඤා කරමින් නමස්කාර කිරීමට පටන් ගත්තේය. එවිට මා භයෙන් හා වෙව්ලුමෙන් යුතුව එය බැලීමට දිව ගියෙමි. නමුත් එහි කිසිවෙක් සිටියේ නැත. මා දුටු දර්ශනයේ සිටි සෙනඟ සහ මෙම සෙනඟ සහ මෙම මනුෂ්‍යයා ඇතුලු කිසිවෙක් එහි සිටියේ නැත.

විනාඩි කිහිපයකට පසුව දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක් වූ පූජක දොස්තර බෙවින් ලෝරන්ස් සහ ශෙරීනා බෙවින් නැමති ඔහුගේ බිරිඳද අලුත ඉපදුන ඔවුන්ගේ දරුවාද සමඟ අප සභාවට ඇතුල්වුනේය. අද දවසේදී මෙම ස්ථානයට එන්නය කියා ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන්ට මඟ පෙන්වූ බව පැවසීය. ටික වේලාවකට පසුව තවත් අලුත් සෙනඟ එන්නට පටන් ගත්තේය. මෙසේ දෙවියන්වහන්සේ ටික ටික සෙනඟ අප දේව ගෘහයට එවීමට පටන් ගත්තේය.

අපගේ දෙවියන්වහන්සේ සෑම විටම යහපත්ය. උන්වහන්සේ ඕනෑම කෙනෙකුගේ ජීවිතයේ හාස්කමක් කිරීමට කැමැත්තෙන් සිටී. අද දවසේදී උන්වහන්සේ ඔබගේ ජීවිතයට පැමිණ ඔබට ආශිර්වාද කරන සේක.

*******

7 පිටුවෙන්....

**යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක, මමද මාගේ පියාණන් වෙතට යමි. එහෙත් මා ඔබව අනාථව අත් නොහරමි.**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ට මෙසේ පැවසූ සේක. ***''නුමුත් දැන් මා එවූ තැනැන්වහන්සේ ළඟට යමි...'' (යොහාන් 16:5) ''නුඹලා අනාථව නාරින්නෙමි...'' (යොහාන් 14:18)*** අනාථව යන්නෙහි තේරුම නම්, පියවරුන් නොමැති අයයි.

ඔබත් ගෝලයින් මෙන් සිතන්නට පුළුවනි. ඔබ තනිවී සිටිනවාය කියාත් දෙවියන්වහන්සේ ඔබ වෙනුවෙන් ක්‍රියා කරන්නේ නැත, කියාත් සිතනවා ඇත. ස්වාමීන්වහන්සේ ඔබ ගැන සලකන බව ඔප්පු කිරීමට යම් සාක්ෂියක් නැතිවෙන්නට පුළුවන. යක්ෂයා ඔබට බොරු පවසා ඔබ අනාථය කියා පැවසීමට පුවළුන. දෙවියන්වහන්සේගේ ආත්මය ඔබව අත්හැර දමා ඇත කියා පවසයි. ඔබ වයසට යන විටදී දෙවියන්වහන්සේ ඔබව අත්හරියි කියා පවසයි.

මෙය යක්ෂයාගේ බොරුවයි. ඔබ අමතක නොකල යුතු දෙයක් ඇත. එනම්, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන්ට පවසන දෙය නම්, මා ඔබව අනාථව නාරිමි. මා ඔබ වෙනුවෙන් මිලයක් ගෙවා ඇත.

ඔබ අද මුහුණ දෙමින් යන්නාවූ ප්‍රශ්න හා කරදර මොනවා වුවත් කමක් නැත. ඔබගේ ස්වර්ගීය පියා ඔබව අමතක කර දමා හෝ අත්හැර දමා නැත. උන්වහන්සේගේ පොරොන්දු දෙස බලන්න.

***''නුමුත් සියොන්, යෙහෝවඃවහන්සේ මා අත්හැරියසේක. ස්වාමීන්වහන්සේ මා මතකනැතිකල සේකැයි කීවාය. ස්ත්‍රීයෙක් ඇගේම කුසේ පුත්‍රයාට අනුකම්පා නොකරන ලෙස ඇගේ කිරි දරුවා මතකනැති කරන්ට ඇට පුළුවන්ද? එසේය, මොවුන්ට මතක නැති වෙන්ට පුළුවන, එහෙත් මම නම් නුඹ මතක නැති නොකරන්නෙමි. බලව, මම මාගේ අතුල්වල නුඹ කොටාගතිමි. නුඹේ පවුරු මා ඉදිරියේ නිතරම තිබේ. (යෙසායා 49:14-16)***

මෙම කොටසින් අපට පවසන්නාවූ දෙය නම්, ඔබට අවශ්‍ය ආරක්ෂාව නිතරම මා ඉදිරියේ මගේ ඇස් නුඹෙන් ඉවතට ගෙන නැත. මගේ ආරක්ෂාවත් රැකවරණයත් නිතරම ඔබට ඇත.

මා දන්නාවූ කාරණයක් නම් සමහර මවුවරුන්, පාලකවරුන්, භාර්‍යාවන් තමාගේ දරුවන්ට අත්හැර තිබේ. මීට සතියකට පෙරදී එක් පාලකරයෙක් මා හට මෙසේ ලියා තිබුණි. මා විවාහ වී දැනට වසර 25 ක් ගතවූ අතර මෑතකදී මගේ භාර්‍යාව අන්තර් ජාලය හරහා හඳුනාගත් පුද්ගලයෙකු සමඟ මා සහ මගේ දරුවන්ද හැර දමා ගියේය. මා තවමත් ඇයට ප්‍රේම කරමි. නැවත ඇය නිවසට පැමිණෙනවා නම් මා කැමැත්තෙමි. නමුත් ඇය නැවත පැමිණෙන්නේ නැත. මේ නිසා මා තිත්තකමෙන් සිටිමි. මට නිදා ගැනීමට පවා බැරිය. මෙයින් ජය ගන්නේ කෙසේද කියා මා නොදනිමි.

දෙවියන්වහන්සේ මෙම මනුෂ්‍යයාට මෙසේ පිළිතුරු දුන්නේය. ඔබගේ බිරිඳ ඔබව අතහැර දමා ගිය නමුත් මා ඔබව අත්හැර නොයමි. මා ඔබ වඩා තාප්පයක් ලෙස සිටිමි.

වසර ගණනාවක් ස්වාමි පුරුෂයා නොමැතිව ජීවත් වූ කාන්තාවන් බොහෝ දෙනෙක් අපට මෙසේ ලිපි ලියා එවනු ලැබීය. මා මේවා කියවන විටදී මා දෙවියන්වහන්සේගෙන් මෙසේ අසමි. ''මේ විශ්වාසවන්තවූ කාන්තාව මෙලෙස දුක්විඳින්නේ ඇයි? මෙපමන කාලයකට ඔවුන්ට කිසිම බලාපොරොත්තුවක් නැත. මගේම භාර්‍යාව වසර ගණනාවක් පුරා ශාරීරිකව රෝගීව සිටිමින් දුක් විඳිනු ලැබීය. එසේ දුක් වින්දේ ඇයි? කියා මට තවමත් තේරුම් ගැනීමට බැරිය. ඇගේ ශරීරයේ ශෛල්‍යකර්ම 28 ක් කර ඇත. එයින් 6 ක් පිළිකාවක් වූ අතර ඇය වසර 40 ක් පුරා ඉතා වේදනාවෙන් සිටිනු ලැබීය. මගේ බිරිඳ මෙලෙස දුක් විඳිනු ලබන්නේ ඇයිඃ කියන ප්‍රශ්නයට පිළිතුරු දීමට අද කිසිම දේව ධර්මාචාර්‍යවරයෙකුට හෝ දේව දාසයෙකුට බැරි වී තිබේ.

එහෙත් අප කෙතරම් වේදනාකාරී තත්වයන් තුළින් ගමන්කරනු ලැබුවත් දෙවියන්වහන්සේ විශ්වාසන්තව සිටින බව අපි දනිමු.

**සැමදේ තුළින්ම අපව ජීවත් කිරීමට උන්වහන්සේගේ කරුණාව අපට සෑහෙයි.**

***අපෝස්තුලු පාවුලු තුමා දෙවියන්වහන්සේට මෙසේ යාච්ඤා කලේය. ''ස්වාමිනී, මාගේ මාංශයේ ඇති මෙම කටුව මගෙන් ඉවත් කරන්න''ය කියා මොරගැසූ නමුත් ස්වාමීන්වහන්සේ ඔහුට දුන් පිලිතුර වූයේ ''..මාගේ කරුණාව නුඹට සෑහෙයි...'' (2 කොරින්ති 12:9)*** එනම්, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ මෙහෙකරුවාට පවසනු ලැබූයේ, ''පාවුලු නුඹ මේ කටුව සමඟ ජීවත් වෙන්නට යනවා. නමුත් නුඹගේ වේදනාව මධ්‍යයේ මම නුඹට අවශ්‍ය කරන්නාවූ සියලුම කරුණාව දෙන්නට යනවා.'' යනුවෙනි.

අපගේ සියලුම අවස්ථාවන් යලදී උන්වහන්සේගේ කරුණාව අප සමඟ තිබෙන බවත් එය ඉතා බලසම්පන්න බවත් අප දැනගන්නවාට උන්වහන්සේ කැමැත්තෙන් සිටී. උන්වහන්සේගේ කරුණාව කරනකොටගෙන අපට එළිදරව්වක් ලැබේ. යේසුස් වහන්සේද දෙවියන්වහන්සේගේ කරුණාව සියලු ආකාර ශුද්ධකමෙන් හා අනුකම්පාවෙන් අපට එළිදැක්වූවේය.

අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ අපගේ සෑම දුකම දකින දෙව් පියාණන් වහන්සේය. උන්වහන්සේගේ අනර්ඝ පොරොන්දු අපට දී තිබේ.

*''නුමුත් ධර්මිෂ්ඨයින්ගේ ගැළවීම ස්වාමීන්වහන්සේගෙන්ය. විපත්ති කාලයේදී උන්වහන්සේ ඔවුන්ගේ බලකොටුව වනසේක...''(ගීතාවලිය 37:39)*

***''..... මම කිසිසේත් නුඹෙන් අහක්ව නොයමි, කිසි අන්දමකින්වත් නුඹ අත් නොහරිමියි... ස්වාමීන්වහන්සේ මාගේ උපකාර කාරයාණෝය. මම භය නොවන්නෙමි. මනුෂ්‍යා මට කරන්නේ කුමක්ද?...'' (හෙබ්‍රෙව් 13:5-6)***

***''භය නොවෙන්න, මක්නිසාද මම නුඹ සමඟ සිටිමි, තැති නොගන්න, මක්නිසාද මම නුඹේ දෙවියන්වහන්සේය. මම නුඹ ශක්තිමත්කොට නුඹට උපකාර කරන්නෙමි. එසේය, මාගේ ධර්මිෂ්ඨකම නැමැති දකුණතින් නුඹ උසුලන්නෙමි.***

***නුඹ කෙරෙහි කෝපව සිටින සියල්ලෝම ලැජ්ජා වී වියවුල්වන්නෝය. නුඹ සමඟ***

RNI NO. TN/SIH/2006/17846

*විවාදකරන්නෝ කිසිත් නැතිකම මෙන් විනාශවන්නෝය.*

*තුඹ සමඟ විවාදයට සිටින මනුෂ්‍යයන් තුඹ සොයන නුමුත් ඔවුන් සම්භවෙන්නේ නැත. තුඹට විරුද්ධව යුද්ධකරන මනුෂ්‍යයෝ කිසිත් නැතිකමත් හිස්කමක් මෙන් වන්නෝය.*

*මක්නිසාද තුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ වන මම භය නොවෙන්න, මම තුඹට පිහිට වන්නෙමියි කියමින් තුඹේ දකුණතින් අල්ලන්නෙමි.*

*අසරණයන්ද, දිළින්ඳන්ද වතුර සොයා නොලැබ ඔවුන්ගේ දිව් පිපාසයෙන් වේලෙන කළ, ස්වාමීන්වහන්සේ වන මම ඔවුන්ට උත්තරදෙන්නෙමි. ඉශ්‍රායෙල්හි දෙවියන්වහන්සේ වන මම ඔවුන් අත්නාරිමි'' (යෙසායා 41:10-13/17)*

*ඔබගේ ජීවිතයේ සෑම ගැටළුකාරී විනාශකාරී අවස්ථාවන් වලදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහත් වූ කරුණාව කරුණකොට ගෙන ඔබට ජයගත හැකිය. ඔබගේ ප්‍රශ්නය කුමක් වුවත් උන්වහන්සේගේ කරුණාව ඔබට සෑහෙන්නේය. ශුද්ධාත්මයාණන් ඔබව සනසත සේක.*

*''එබැවින් මහත් විපාකයන් ඇත්තා වූ නුඹලාගේ නිසැකකම අත්නාරින්න'' (හෙබ්‍රෙව් 10:35)*

*''එබැවින් දෙවියන්වහන්සේ සුදුසු කාලයේදී නුඹලා උසස් කරන පිණිස උන්වහන්සේගේ බලවත් හස්තයට යටත් වෙන්න'' (1 පේතෘස් 5:6)*

*******

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.


**ECHO OF HIS CALL**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852

E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com



**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS / 1 Patrika Channel"**

on 2nd **SEPTEMBER 2023.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

**P.O. Box No. 2957,**

**Chepauk, Chennai - 600 005, INDIA.**

**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**


***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**